සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## භූගෝල විද්‍යාව - I

නම/විභාග අංකය :- ........................................................ කාලය: පැය 01 යි.

- ❖ මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40කින් සමන්විත ය.
- ❖ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුව සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

---

- ❖ අක 01 සිට 10 තෙක් ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

(01) සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක අතර ජීවීන් සහිත එකම ග්‍රහලෝකය ................................................................ වේ.
(අඟහරු / පෘථිවිය / බුධ)

(02) පෘථිවි කබොල ප්‍රාවරණයෙන් වෙන් වන සීමාව ................................................ නමින් හැඳින්වේ.
(ගුටෙන්බර්ග් / මොහොරොවිසික් / ප්‍රාවරණය)

(03) පෘථිවි පද්ධතිය උප පද්ධති ............................................ සමන්විත වේ.
(2 / 4 / 6)

(04) ...................................... සම්පූර්ණයෙන් ම ගොඩබිමින් වට වූ මුහුදකි. (කැස්පියන් / රතු මුහුද / ජපන් මුහුද)

(05) මිනිසාගේ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වන ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලිය ..................................... තුළ සිදුවේ.
(පරිවර්ති ගෝලය / ජෛවගෝලය / වායුගෝලය)

- ● අංක 06 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් ' නි ' යන්න වටා ද වැරදි නම් ' වැ ' යන්න වටා ද රවුමක් අඳින්න.

(06) පෘථිවියේ මුළු භූමි ප්‍රමාණයෙන් 29 % ගොඩබිම ය. නි / වැ

(07) හවායි හා අයිස්ලන්ත දූපත් ගැඹුරු සාගරයේ යමහල් ක්‍රියාකාරීත්වය නිසා ඇති වූ දූපත් දෙකකි. නි / වැ

(08) ශ්‍රී ලංකා සංචාරක අධිකාරිය විසින් ප්‍රධාන සංචාරක කලාප හයක් හඳුනාගෙන ඇත. නි / වැ

(09) 1 : 50,000 භූ ලක්ෂණ සිතියම නිර්මාණය සඳහා තීරයක් මර්කේටර් ප්‍රක්ශේපණය පදනම් කරගෙන ඇත. නි / වැ

(10) නයිල් ගඟ විලකින් ආරම්භ වන ගංගාවකි. නි / වැ

- ● අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

(11) පෘථිවිය මතුපිට සිට අභ්‍යන්තරයට යන විට උෂ්ණත්වය ක්‍රමයෙන්........................................ වේ.

(12) පෘථිවි ජලගෝලයේ ජලය, ශිලාගෝලය වායුගෝලය හා ජෛව ගෝලය අතර හුවමාරු වීමේ ක්‍රියාවලිය ............................................ ලෙස හඳුන්වයි.

(13) ගෝලීය ජල ප්‍රමාණයෙන් මිනිසාට භාවිතයට ගත හැකි මතුපිට මිරිදිය ජල ප්‍රමාණය ............................................ % කි.


(14) භූ තැටි ප්‍රාවරණ තුළ ක්‍රියාත්මක වන ........................................................ ධාරාවල බලපෑමෙන් චලනය වේ

(15) ආසියාවෙන් බැහැරව වී වගා කරනු ලබන ප්‍රදේශයක් වූ මරේ ඩාලිං ගංගා නිම්නය පිහිටා ඇත්තේ ........................................................ මහද්වීපයේ ය.



EXAMRESULTS.LK

- දී ඇති ප්‍රස්ථාරය හොඳින් අධ්‍යයනය කර අසා ඇති. ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.





(16) ප්‍රස්ථාරයට අනුව වැඩිම වර්ෂාපතනයක් ලැබී ඇති මාසය කුමක් ද?

(17) අඩුම වර්ෂාපතනයක් ලැබී ඇති මාසය කුමක් ද?

(18) වර්ෂාපතන ප්‍රමාණය අනුව වියලි කාලගුණයක් පවතීයයි අනුමාන කල හැකි මාස මොනවා ද?

- ප්‍රශ්න අංක 19 සිට 22 දක්වා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා දී ඇති ලංකා සිතියම යොදා ගන්න.




(19) A අක්ෂරයෙන් දැක්වෙන සමුද්‍ර සන්ධිය කුමක් ද?

(20) B අක්ෂරයෙන් දක්වෙන්නේ නාවික සැතපුම් 12 කලාපයයි එය හැඳින්වෙන්නේ කෙසේ ද?

(21) C අක්ෂරයෙන් දක්වෙන කලාපය කුමක් ද?

(22) පරම ආර්ථික කලාපය දක්වෙන අක්ෂරය කුමක් ද?

- 23 සිට 30 තෙක් දී ඇති ප්‍රශ්නවල ' අ ' සහ ' ආ ' යනුවෙන් අක්ෂර දෙකක් දක්වේ. ඒවා නිවැරදිව ගලපා පිළිතුරට හිමි අංකය තිත් ඉරමත ලියා දක්වන්න.

(23) "අ" — පර්යේෂණ ආයතන

1. බෝඹුවල
2. තලවකැලේ
3. මාතලේ

"ආ" — බෝග වර්ග

A - සුළු අපනයන
B - වී
C - තේ
D - රබර්

(1) A,B,D (2) B,C,A (3) C,D,A (4) D,C,A (..................)

(24) "අ" — ධීවර කර්මාන්තයේ අංශ

1. මිරිදිය
2. වෙරළාසන්න
3. කිවුල් දිය

"ආ" — මසුන් වර්ග

A - ඉස්සා, කකුළුවා
B - හාල්මැස්සා, හුරුල්ලා
C - ලූලා, කනයා
D - තෝරා, මෝරා

(1) A,B,C (2) B,C,A (3) C,B,A (4) D,A,C (..................)

(25) "අ" "ආ"

මහාද්වීපය | විල්

1. ආසියාව — A - බයිකල්
2. ඕස්ට්‍රේලියාව — B - ලැගෝඩා
3. යුරෝපය — C - ටිටිකාකා
D - අයර්විල

(1) A,D,B (2) B,C,A (3) C,B,A (4) D,A,B (..................)

(26) "අ" "ආ"

දේශගුණ වර්ගය | විශේෂ ලක්ෂණ

1. නිවර්තන — A - පැහැදිලි සෘතු භේදයක් ඇත
2. සෞම්‍ය — B - තුහින හා හිමපතනය ඇත.
3. ශීත — C - ශුෂ්ක ප්‍රදේශ
D - ශීත සෘතුවක් නැත

(1) A,D,B (2) B,C,A (3) C,B,A (4) D,A,B (..................)

(27) "අ" "ආ"

වායුගෝලීය ස්තර | විශේෂ ලක්ෂණ

1. පරිවර්ති — A - ඕසෝන් ස්තරය
2. අපවර්ති — B - පරිසර පතන ශීඝ්‍රතාව
3. මෙසෝ — C - විද්‍යුත් ක්‍රියාවලිය බහුල වීම
D - වායු පරිමාව ඉතා අඩුය

(1) A,D,B (2) B,A,C (3) C,A,B (4) B,C,A (..................)

(28) "අ" "ආ"

භූ තැටි | රට

1. ඉන්දු ඕස්ට්‍රේලියානු භූ තැටිය — A - මැඩගස්කරය
2. අප්‍රිකානු තැටිය — B - බ්‍රිතාන්‍ය දූපත්
3. යුරේෂියානු තැටිය — C - ශ්‍රී ලංකාව
D - බ්‍රසීලය

(1) A,D,B (2) B,C,A (3) C,A,B (4) D,A,B (..................)

(29) "අ" "ආ"

සිතියම් පත්‍රයක අන්තර්ගත තොරතුරු | සිතියමේ දක්වෙන ස්ථාන

1. සිතියම් පත්‍රයේ නම — A - වට තීරුවේ ඉහළ
2. ජාතික කණ්ඩාංක — B - සිතියම් මුහුණත
3. භෞතික හා සංස්කෘතික ලක්ෂණ — C - ඇතුළු මායිම් තීරුව
D - වට තීරුව පහල

(1) A,C,B (2) A,D,B (3) B,A,D (4) D,A,C (..................)

(30) "අ" "ආ"

ප්‍රධාන සාගර / පිහිටා ඇති මුහුද

1. ඉන්දියන් සාගරය — A - කහ මුහුද
2. පැසිෆික් සාගරය — B - එරල් මුහුද
3. අත්ලාන්තික් සාගරය — C - කැරිබියන් මුහුද
D - අරාබි මුහුද

(1) A,B,D (2) B,A,C (3) C,A,D (4) D,A,C (.................)

- **31 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉරමත ලියා දක්වන්න.**

(31) මාෂ භෝග සඳහා පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවා ඇත්තේ,
(1) ගන්නෝරුවේ ය. (2) අඟුනුකොළ පැලැස්සේ ය.
(3) බටඅතය (4) රාජාංගනයේ ය.

(32) 1 : 50,000 පරිමාණයට අනුව සකස් කළ ශ්‍රී ලංකාවේ භූ ලක්ෂණ සිතියම් වල සමෝච්ච රේඛා අන්තරය
(1) මීටර් 20 කි. (2) මීටර් 10 කි. (3) මීටර් 100 කි. (4) මීටර් 500 කි.

(33) හෙල්මළු ක්‍රමයට වී වගා කරනු ලබන දිස්ත්‍රික්කයක් වන්නේ,
(1) අනුරාධපුරය ය. (2) කුරුණෑගල ය.
(3) මහනුවර ය. (4) ගාල්ල ය.

(34) පෙට්‍රෝලියම් පිරිපහදුවේ දී ප්‍රධාන වශයෙන් පැට්‍රල්, ඩීසල්, භූමිතෙල් යන ද්‍රව්‍ය ඇසුරෙන් කෙරෙන නිෂ්පාදන කර්මාන්ත හඳුන්වන්නේ,
(1) විද්‍යුත් කර්මාන්ත (2) පෙට්‍රෝ රසායන කර්මාන්ත
(3) ගෘහ කර්මාන්ත (4) මෝටර් රථ කර්මාන්තය

(35) කිරි ගව සම්පත් භුවමාරු කර ගැනීම සඳහා කිරි ගව සම්පත් මධ්‍යස්ථානයක් පිහිටුවා ඇත්තේ,
(1) කනන්විල ය. (2) අඹේවෙල ය.
(3) වල්පිට ය. (4) මීවනපලාන ය.

(36) ගෙවතු වගාවක් ලෙස දිවයිනේ සෑම ප්‍රදේශයකම පාහේ ව්‍යාප්ත වී ඇති බෝගය වන්නේ,
(1) රබර් (2) පොල් (3) තේ (4) වී

(37) රසායනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීමේ අරමුණින් කාබනික පොහොර මධ්‍යස්ථානයක් පිහිටුවා ඇති දිස්ත්‍රික්කය
(1) මාතර (2) මහනුවර (3) කුරුණෑගල (4) කොළඹ

(38) ලෝකයේ වැඩි වශයෙන් නිෂ්පාදනය හා පරිභෝජනය කරන ධාන්‍ය වර්ගය වන්නේ,
(1) වී (2) ඉරිඟු (3) බාර්ලි (4) තිරිඟු

(39) ලොව සමස්ත මිරිදිය ජල ප්‍රමාණයෙන් අයිස් තට්ටු සහ ග්ලැසියර් ලෙස පවතින ජල ප්‍රමාණය කොපමණ ද?
(1) 79% (2) 20% (3) 97% (4) 30%

(40) වායුගෝලය, ජලගෝලය, ශිලාගෝලය යන තුන් කොටසේ ම අන්තර් ක්‍රියාකාරීත්වය මත රඳා පවතින කලාපය මින් කුමක්ද?
(1) අපරිවර්තී මණ්ඩලය (2) ජෛව ගෝලය
(3) අයන ගෝලය (4) පරිවර්ති මණ්ඩලය

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 10 - ශ්‍රේණිය

## භූගෝල විද්‍යාව - II

නම/විභාග අංකය :- .......................................................... කාලය: පැය 02 යි.

- මෙම ප්‍රශ්න පත්‍රය I සහ II වශයෙන් කොටස් 02කි.
- I කොටස අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් තුනට ම පිළිතුරු සැපයිය යුතු ය.
- II කොටසින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු ය.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

### I කොටස

(01) (අ) ඔබ වෙත සපයා ඇති 1: 50,000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කොට ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) අංක 01 න් දක්වා ඇති මායිම කුමක් ද? (දිස්ත්‍රික් / පළාත් / ප්‍රාදේශීය ලේකම්) (ලකුණු 01)

(ii) අංක 02 න් දක්වා ඇත්තේ කුමක් ද? (ඓතිහාසික ස්ථානය / පාසල / හින්දු කෝවිල) (ලකුණු 01)

(iii) සිතියමේ දැක්වෙන ප්‍රධාන මාර්ගයේ දිග කිලෝමීටර් (5.5 / 8.5 / 10) කි. (ලකුණු 01)

(iv) A අක්ෂරයෙන් දක්වා ඇති ලක්ෂණය වන්නේ (ගල / ගල්වල / ලඳු කැලෑ) (ලකුණු 01)

(v) B අක්ෂරයෙන් දක්වා ඇති වෘක්ෂලතාවරණය වන්නේ (වනාන්තර / ලඳුකැලෑ / හේන) (ලකුණු 01)

(vi) C අක්ෂරයෙන් දක්වා ඇත්තේ කුමක්ද? (ලකුණු 01)

(vii) D අක්ෂරයෙන් දක්වා ඇත්තේ කුමක් ද? (ලකුණු 01)


- **සිතියම් ප්‍රදේශය පිළිබඳ ප්‍රකාශ තුනක් පහත දැක්වේ. ඒම ප්‍රකාශ නිවැරදි නම් ' නි ' යන්න ද වැරදි නම් ' වැ ' යන්න ද ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.**

(viii) (a) සිතියම් ප්‍රදේශයේ ජනාවාස ව්‍යාප්තිය මාර්ග දෙපස දක්නට ලැබේ. නි / වැ (ලකුණු 01)

(b) මෙම ප්‍රදේශයේ විශාල වශයෙන් වී වගාව ව්‍යාප්තව ඇත. නි / වැ (ලකුණු 01)

(c) සිතියම් ප්‍රදේශයේ නැගෙනහිර අර්ධය තැනිතලා ප්‍රදේශයකි. නි / වැ (ලකුණු 01)

(ආ) සපයා ඇති ලෝක සිතියම අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




(i) A, B, C අක්ෂර අතුරෙන් බුරව් සුළි කුණාටුව ආරම්භ වූ බොක්ක දැක්වෙන අක්ෂරය කුමක් ද?


(ii) D, E, F අක්ෂර අතුරෙන් මහා බාධක කඳුවැටිය දක්වෙන අක්ෂරය කුමක් ද?

(iii) G, H, J අතුරෙන් කොංගෝ ගඟ දක්වෙන අක්ෂරය කුමක් ද?

(iv) K, L, M අක්ෂර අතුරෙන් ප්‍රංශය දක්වෙන අක්ෂරය කුමක් ද?

(v) N, P, Q අතුරෙන් මලක්කා සමුද්‍ර සන්ධිය දක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 05)

(ඉ) සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියම අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි අක්ෂරය තෝරන්න.




(i) ලුණුවිල පොල් පර්යේෂණ ආයතනය - A, B, C


(ii) කිලිනොච්චි දිස්ත්‍රික්කය - D, E, F

(iii) මඩකලපුව නගරය - G, H, J

(iv) මිටියාගොඩ කෙඹලින් නිධිය - K, L, M

(v) තම්බපන්නි බලාගාරය පිහිටි දිස්ත්‍රික්කය - P, Q, R (ලකුණු

05)




**II කොටස**

(02) යාබද රූප සටහනේ දක්වෙන්නේ පෘථිවියේ ව්‍යුහයයි.

(i) මෙහි 1 හා 2 ස්තර නම් කරන්න. (ලකුණු 02)

(ii) පෘථිවි ව්‍යුහයට අනුව ශිලා ගෝලයට අයත් වන ප්‍රධාන කොටස් දෙක සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) අංක 5 න් දක්වෙන ස්ථරය මිනිසාට ප්‍රයෝජනවත් වන්නේ කෙසේදැයි කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03) (i) (a) ජලයෙන් වට වූ විශාල ගොඩබිම් හඳුන්වන්නේ කුමන නමකින් ද?

(b) මුදුන් කිහිපයකින් යුතු විවිධ බෑවුම් සහිත ඉහල උන්නතාංශයක් ඇති එක දිගට විහිදෙන භූ රූප හඳුන්වන්නේ කෙසේ ද? (ලකුණු 02)

(ii) (a) ලෝකයේ විශාලම විල කුමක් ද?

(b) දකුණු ඇමරිකාවේ පිහිටි විශාලම ගංගාව කුමක් ද?


(c) ආසියා මහද්වීපයේ පිහිටි සානුවක් නම් කරන්න. (ලකුණු 03)

(iii) ගංගා පද්ධති මානුෂ ක්‍රියාකාරකම් වලදී වැදගත් වන ආකාරය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(04) (i) දේශගුණය යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

(ii) යාබද රූපයේ 1, 2, 3 ලෙස දක්වෙන ප්‍රධාන දේශගුණ කලාප නම් කරන්න. (ලකුණු 03)

(iii) ඔබ නම් කල දෙවන කලාපයේ විශේෂ ලක්‍ෂණ තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)




(05) පහත ලෝක ආකෘති සිතියමේ ලෝකයේ වී වගා කරන ප්‍රදේශ දක්වා තිබේ.



(05) (i) එහි A, B වශයෙන් සඳහන් කර ඇති වී වගා කරන ප්‍රදේශ දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) වී වගාවට බලපාන සාධක තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) තිරිඟු වගාවේ දියුණුවට බලපා ඇති හේතු දෙකක් සඳහන් කරන්න.


(b) තිරිඟු වගාව ආශ්‍රිත විශේෂ ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 05)

(06) (i) යාබද සිතියමේ ශ්‍රී ලංකාවේ තේ වගා කරන දිස්ත්‍රික්ක දෙකක් දක්වා ඇත. ඒවා නම් කරන්න. (ලකුණු 02)

(ii) තේ වගාවට බලපාන සාධක දෙකක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) තේ වගාවට ආශ්‍රිත ගැටලු දෙකක් ද?

(b) තේ වගාව ආශ්‍රිත නව ප්‍රවණතා දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)




(07) (i) මෝටර් රථ කර්මාන්තයට ප්‍රසිද්ධ ආසියාතික රටවල් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) මෝටර් රථ කර්මාන්තයේ ලක්ෂණයක් සහ ප්‍රවණතා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) ආසියාතික රටවල නැව් තැනීමේ කර්මාන්තය දියුණු වීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න.

(b) නැව් තැනීමේ කර්මාන්තයේ ප්‍රවණතා දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(08) (i) ආහාර හා පාන වර්ග නිෂ්පාදන කර්මාන්ත වැඩි වශයෙන් ස්ථාන ගත වී ඇති ප්‍රදේශ මොනවා ද? (ලකුණු 02)

(ii) මෙම කර්මාන්තය මෑත කාලයේ දියුණු වීමට බලපා ඇති හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) මෙම කර්මාන්තය මුහුණ පා ඇති ගැටලු දෙකක් දක්වන්න.

(b) මෙම කර්මාන්තයේ නව ප්‍රවණතා දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(09) (i) පහත සඳහන් ප්‍රදේශ වල ව්‍යාප්ත වී ඇති හස්ත කර්මාන්ත නම් කරන්න.


(a) කොග්ගල

(b) අම්බලන්ගොඩ (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ හස්ත කර්මාන්ත දියුණු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය මුහුණ පා ඇති ගැටලු දෙකක් සඳහන් කරන්න.

(b) සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)



Pallewela
PROVINCE
OF UVA
Ford
Kadupara
Puskivula
THAMBALEYGALA
400
300
200
215
134
214
213
133
212
211
132
172.0
LEYGALLA NO 2
Makulewala
Kandura
Kadiruli Ela
Kolamantala
Malgasdeniya
Hewanewala
Kehelpelebedda
Galpihi
Miriswatt
Kemmalapit
Egollamulla
MUDAGALA
348.69
Aralupitiya
Kolampitiya
Ela
Kadapalla
AMPARA
BADU
A
B
C
D
1
2

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## භූගෝල විද්‍යාව - පිළිතුරු

### භූගෝල විද්‍යාව I

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | පෘථිවිය | (11) | වැඩි | (21) | යාබද කලාපය | (31) | 2 |
| (2) | මොහොරොවිසික් | (12) | ජල චක්‍රය | (22) | D | (32) | 1 |
| (3) | නයිට්‍රජන් | (13) | 1 | (23) | 2 (B,C,A) | (33) | 3 |
| (4) | කැස්පියන් | (14) | සංවහන | (24) | 3 (C,B,A) | (34) | 2 |
| (5) | ජෛවගෝලය | (15) | ඕස්ට්‍රේලියාව | (25) | 1 (A,D,B) | (35) | 4 |
| (6) | ✓ | (16) | නොවැම්බර් | (26) | 4 (D,A,B) | (36) | 2 |
| (7) | ✓ | (17) | ජුනි | (27) | 2 (B,A,C) | (37) | 3 |
| (8) | × | (18) | ජුනි/ජූලි/අගෝස්තු | (28) | 3 (C,A,B) | (38) | 4 |
| (9) | ✓ | (19) | පෝක් සමුද්‍ර සන්ධිය | (29) | 2 (A,C,B) | (39) | 1 |
| (10) | ✓ | (20) | රාජ්‍යීය මුහුදු ප්‍රදේශය | (30) | 4 (D,A,C) | (40) | 2 |

(ලකුණු 1×40=40)

### භූගෝල විද්‍යාව II

(01) (අ)
- (i) පළාත
- (ii) ඓතිහාසික ස්ථානය
- (iii) 5.5
- (iv) ගල
- (v) වනාන්තර
- (vi) අක්ෂාංශ / දේශාංශ රේඛා
- (vii) අත් හරින ලද පාළු වැව
- (viii) (a) නි (b) වැ (c) වැ

(ආ)
- (i) B
- (ii) D
- (iii) H
- (iv) L
- (v) P

(ඉ)
- (i) A
- (ii) D
- (iii) H
- (iv) L
- (v) P

(02)
- (i) 1 - ඇතුලත හරය
  2 - පිටත හරය
- (ii) කබොල හා ඉහළ ප්‍රාවරණය
- (iii)
  - මිනිස් ක්‍රියාකාරකම් සිදුවන කලාපය කබොල වේ.
  - මිනිසාගේ ප්‍රයෝජනය සඳහා නිවාස පද්ධති ඉදි කිරීම.
  - කෘෂිකාර්මික කටයුතු සිදු කිරීම
  - යටිතල පහසුකම් දියුණු කිරීම

(03) (i) (a) මහද්වීප
(b) කඳුවැටි

(ii) (a) සුපීරියර්
(b) ඇමසන්
(c) ටිබෙට් / පාමීර් / ඩෙකෑන් / අරාබි ආදී....

(iii) - මිනිසාට අවශ්‍ය ජලය ලබා ගැනීම
- පරිසරය සිසිල්ව තබා ගැනීම
- වාරි මාර්ග පද්ධති නඩත්තු කිරීම
- ජල විදුලිය ලබා ගැනීම
- කෘෂිකර්මාන්තයට අවශ්‍ය ජලය ලබා ගැනීම
- ජල ක්‍රීඩා සඳහා භාවිතය
- මිරිදිය ධීවර කර්මාන්තය

(04) (i) දීර්ඝ කාලයක් තිස්සේ වායුගෝලයේ පවතින සාමාන්‍ය තත්ත්වය

(ii) - උෂ්ණත්වය අධිකතම කලාපය වේ.
- උෂ්ණත්වයේ ද විවිධත්වයක් ඇත.
- වර්ෂාපතනයේ ද විවිධත්වයක් ඇත.
- වර්ෂාපතනය වැඩි මෙන්ම අඩු ප්‍රදේශ ද ඇති අතර වසර පුරා පැතිරුණු වර්ෂාපතනයක් දක්නට ලැබේ.
- ඇමසන්, කොංගෝ වැනි වනාන්තර මෙන්ම අරාබි, තාර්, සහරා වැනි කාන්තාර ප්‍රදේශ ද ඇත.
- විශාල නාය යෑම් ප්‍රදේශ ද ඇත.

(iii) විස්තරය අනුව ලකුණු ලබා දෙන්න.

(05) (i) (a) - නයිල් ඩෙල්ටාව (අප්‍රිකාවේ)
(b) - මිසිසිපි නිම්නය (උතුරු ඇමරිකාවේ)

(ii) - $27^{0}C$ පමණ උෂ්ණත්වය
- 2000mm පමණ වර්ෂාපතනය
- තැනිතලා ප්‍රදේශ
- දියලු පස

(iii) (a) - ප්‍රාග්ධනය ආයෝජනය කිරීම
- නවීන තාක්ෂණය හා යන්ත්‍ර සූත්‍ර භාවිතය
- නවීන බීජ වර්ග භාවිතය
- කෘමිනාශක හා කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතය

(b) - ඒක පුද්ගල අස්වනු ප්‍රමාණය වැඩිවීම
- බිම් ප්‍රදේශ ආශ්‍රිත ජන සංඛ්‍යාව අඩු නිසා විශාල බිම් ප්‍රදේශ වල ව්‍යාප්ත වී ඇත.
- ඒක බෝග වගාවක් ලෙස ව්‍යාප්ත වීම.
- දියුණු තාක්ෂණික ශිල්පක්‍රම භාවිතය
- ලොව පුරා පැතිරුණු වෙළඳපොලක් තිබීම
- විවිධ ආහාර සැකසීමට හැකි වීම

(06) (i) A - නුවර එළිය
B - බදුල්ල

(ii) - $15^0c - 17^0c$ අතර උෂ්ණත්වය
- 1900 mm ට වැඩි වර්ෂාපතනය
- ලෝම් හා ලැටරයිට් පස
- මද බෑවුම් සහිත ප්‍රදේශ
- පුහුණු ශ්‍රමය

(iii) (a) - ඉඩම් හිඟය හා කැබලි වීම
- දීර්ඝ කාලීනව වගා කිරීම නිසා පස නිසරු වීම
- අස්වැන්න අඩු වීම
- මිල උච්චාවචනය
- ආදේශන වලින් එල්ල වන තරඟය
- කම්කරු ගැටලු ඇතිවීම

(b) - කෘෂිකාර්මික විවිධාංගීකරණය
- නවීන තාක්ෂණික යන්ත්‍ර යොදා ගැනීම
- පාරිභෝගික සිත් ඇද ගන්නා අයුරින් ආකර්ෂණීය ලෙස නිෂ්පාදනය කිරීම
- නවීන ඇසුරුම් ක්‍රම භාවිත කිරීම
- පෙහොර සහනාධාර ලබාදීම

(07) (i) චීනය, දකුණු කොරියාව, ජපානය, ඉන්දියාව, දකුණු කොරියාව

(ii) ලක්ෂණ - සීඝ්‍රයෙන් වෙනස් වන කර්මාන්තයක් වීම
- විශාල ප්‍රාග්ධනයක් යෙදිය යුතු වීම
- නවීන තාක්ෂණය උපරිම ලෙස යොදා ගැනීම
- අතීතයේ මෝටර් රථ නිෂ්පාදනය නොකල රටවල් නිෂ්පාදනයට යොමු වීම
- එකලස් කිරීමේ කර්මාන්තයක් ලෙස ව්‍යාප්ත වීම

අපේක්ෂා - විවිධ රටවල් ඒකාබද්ධව නිෂ්පාදන එළි දැක්වීම
- අධි සුඛෝපභෝගී රථ වාහන නිපදවීම
- සැහැල්ලු වාහන නිපදවීම
- මෝටර් රථ තුල සුවිශේෂී විද්‍යුත් උපාංග සවි කිරීම

(iii) (a) - ලාභදායී ශ්‍රමය පුහුණු ශ්‍රමය ලබාගත හැකි වීම
- නව තාක්ෂණය යොදා ගැනීම
- තටාක පහසුකම් හා දිය නොම්දෙන මුහුද ප්‍රදේශ බහුල වීම
- ප්‍රාග්ධනය යෙදීමට හැකිවීම

(b) - අධි සුඛෝපභෝගී මගී නැව් නිපදවීම
- විවිධ කාර්යයන් සඳහා නැව් නිපදවීම
- සැහැල්ලු ලෝහ හා ෆයිබර් වැනි ආදේශක යොදා ගැනීම
- ඉන්ධන, බහාලුම්, ප්‍රවාහන නෞකා හා තොග භාණ්ඩ ප්‍රවාහන නෞකා නිෂ්පාදනය

(08) (i) - මහ කොළඹ ආර්ථික කලාපය
- ප්‍රධාන නගර ආශ්‍රිතව
- ජනාධික ප්‍රදේශවල

(ii) - සමාජ වෙනස් වීමත් සමඟ පුද්ගලයාගේ අධිවේගී බව නිසා ඉල්ලුම ඉහළ යාම
- පාරිබෝගිකයන්ගේ ක්‍රය ශක්තිය ඉහල යාම
- ආහාරපාන සඳහා ඉල්ලුම වැඩිවීම
- පහසුවෙන් ලබාගත හැකිවීම, ප්‍රමාණය කිරීමේ පහසුව
- පුද්ගල කැමැත්ත අනුව විවිධ ආහාර ලබාගත හැකිවීම

(iii) (a) - නිෂ්පාදන වියදම් ඉහල යාම නිසා භාණ්ඩ මිල වැඩිවීම
- කෙටි කාලයක් තුළ අලෙවි කළ යුතු වීම නිසා ගබඩා කිරීම් හා අලෙවිය පිළිබඳ ගැටලු මතුවීම
- ආහාරපාන වල ප්‍රමිතිය පිළිබඳ ගැටලු
- ආහාර කල් තබා ගැනීම හා රස ගැන්වීම සඳහා අනුමත නොකරන ලද රසායනික ද්‍රව්‍ය නිසා සෞඛ්‍ය ගැටලු මතුවීම

(b) - සකස් කරන ලද ආහාර පාන වර්ග සඳහා දිනෙන් දින ඉල්ලුම වැඩිවීම
- කුඩා හා ගෘහ කර්මාන්ත වශයෙන් කෙරෙන නිෂ්පාදන වැඩිවීම
- පාරිභෝගික ආකර්ෂණය ඇතිවන පරිදි විවිධ ඇසුරුම් හා ප්‍රචාරණ ක්‍රම ක්‍රියාත්මක වීම
- ආහාර පාන නිෂ්පාදන රැසක් අපනයනය සඳහා ඇසුරුම් කිරීම

(09) (i) a - බීරලු
b - වෙස් මුහුණු

(ii) - දිවි නැගුම ජාතික සංවර්ධන වැඩසටහන
- කර්මාන්ත ගම්මාන ඇති කිරීම
- හස්ත කර්මාන්ත සංවර්ධන වැඩසටහන
- ගෘහ කර්මාන්ත සඳහා ශ්‍රමිකයන් පුහුණු කිරීම
- ප්‍රදර්ශන පැවැත්වීමෙන් නිෂ්පාදනයන් ධෛර්යමත් කිරීම

(iii) (a) - විවිධ වසංගත රෝග නිසා සංචාරක පැමිණීම සීමා කිරීම
- සංචාරක පැමිණීම වසරේ එක් කාලයකට සීමා වීම
- යටිතල පහසුකම් සංවර්ධනය නොවීම
- සමාජ සංස්කෘතික බලපෑම
- පරිසර දූෂණය

(b) - සංචාරක පහසුකම් කඩිනමින් වැඩි දියුණු කිරීම
- පෞද්ගලික අංශය දිරිගැන්වීම
- සංචාරක ව්‍යාපාර ආශ්‍රිතව සෘජු හා වක්‍ර රැකියා ආයතන වැඩි වීම
- සංචාරක හා ආගන්තුක සේවා කටයුතු සඳහා විශේෂ පුහුණු ශ්‍රමිකයන් බිහි කිරීම සඳහා විශ්ව විද්‍යාල ඇතුළු ආයතන යොමුවීම